# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2017

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාර ධර්ම

(Business Law and Ethics)

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 20 ක් වූ අතර වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න 10 කින් යුක්ත විය.

අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණි. ප්‍රශ්නයට වෙන්කර තිබූ මුළු ලකුණු වලින් අඩකට වඩා ඔවුන් ලබාගෙන ඇත.

ප්‍රශ්න අංක 1.3, 1.5 සහ 1.8 සඳහා උත්තර ලිවීමට බොහෝ අයදුම්කරුවන් අසමත් විය. 1.3 ප්‍රශ්නයේදී සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යයක් නොවන්නේ කුමක්දැයි උත්තරයෙන් අපේක්ෂා කළ බව නොසලකා හැර ඇත. ප්‍රතිඵලයක් වශයෙන් එම කොමිෂන් සභාවේ කාර්යභාරයන් තෝරා ගනිමින් වැරදි උත්තර ලකුණු කර තිබුණි. ප්‍රශ්න අංක 1.5 සඳහා උත්තර ලිවීමේදී ඇතැම් අයදුම්කරුවන් භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ගැනුම්කරුවෙකුට තිබෙන ප්‍රතිකර්ම විකුණුම් කරුවෙකුට තිබෙන ප්‍රතිකර්ම හා පටලවා ගැනීමෙන් වැරදි උත්තර ලියා තිබුණි.

ප්‍රශ්න අංක 1.8, ඉතා සරල ඍජු ප්‍රශ්නයක් වූ අතර 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනත යටතේ හඳුනාගෙන ඇති බුද්ධිමය දේපළ වර්ග දෙකක් සඳහන් කිරීමට බොහෝ අයදුම්කරුවන් අසමත් විය. ඉහළ ලකුණු ලබා ගැනීම සඳහා මුළු විෂය නිර්දේශය පිළිබඳව සමස්ථ වශයෙන් අවබෝධය අයදුම්කරුවන් ලබාගත යුතු බව සඳහන් කළ යුතුය.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය ජාත්‍යන්තර වෙළඳාම මත පදනම් වී තිබූ අතර ණයවර ලිපි ක්‍රමය මෙහෙයවීම පිළිබඳව විස්තර කිරීම අවශ්‍යව තිබුණි. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නය නිසිලෙස අවබෝධ කර ගැනීමට අසමත්ව තිබූ අතර, ණයවර ලිපි ක්‍රමය මෙහෙයවන ආකාරය නිවැරදිව විස්තර කර තිබුණේ අඩු සංඛ්‍යාවකි. ඇතැම් අයදුම්කරුවන් ණයවර ලිපික්‍රමයේ ප්‍රතිලාභ, ජාත්‍යන්තර වෙළඳාමේ වෙනත් ගෙවීම් ක්‍රම ආදී අදාල නොවන උත්තර ලියා තිබුණි.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නැත.**

### ප්‍රශ්න අංක 03

ප්‍රායෝගික සිද්ධියක් දී "ගනුදෙනු කළ නොහැක" යනුවෙන් රේඛනය කළ චෙක්පතක් පිළිබඳව පරීක්ෂා කර ඇත. බොහෝ අයදුම්කරුවන් ප්‍රශ්නයට සතුටුදායක අන්දමින් උත්තර ලියා ඇත. දී ඇති සිද්ධියේ "ගනුදෙනු කළ නොහැක" යන්නෙන් රේඛනය කිරීමේ බලපෑම ගැන විස්තර කිරීම වෙනුවට, චෙක්පත් රේඛනය කිරීම, රේඛනය සහිත චෙක්පත් පිළිබඳ බැංකු පටිපාටි යනාදී අදාල නොවන උත්තර සැපයූ සමහර අයදුම්කරුවන් ද විය. නෛතික පසුබිම විස්තර නොකොට, D නමැත්තාට චෙක්පතේ මුදල ලබා ගැනීමට හිමිකම් ඇතැයි යනුවෙන් පමණක් සඳහන් කළ අයදුම්කරුවන් ලකුණු උපයා නැත.

**මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය තරමක් සතුටුදායක බව කිව යුතුය.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නයේ (a) කොටසින් 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත යටතේ ආවරණය කෙරෙන වැරදි තුනක් (3) සහ (b) කොටස යටතේ තොරතුරු සන්නිවේදන තාක්ෂණය සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ බලපැවැත්වෙන වෙනත් නෛතික ආඥා පනත් දෙකක් (2) ක් සඳහන් කිරීම අවශ්‍ය විය. අයදුම්කරුවන් බොහෝ දෙනෙකු මෙම ප්‍රශ්නයට උත්තර ලියා ඇත. සමහර අයදුම්කරුවන් (a) කොටස සඳහා අදාල නොවන කරුණු දැක්වීම නිසා හෝ උදාහරණ ලෙස එකම දේ නැවත ලිවීම නිසා අඩුවෙන් ලකුණු ලබා තිබුණි. (b) කොටස සඳහා ද, අදාල නොවන සහ වැරදි පනත් සඳහන් කර තිබුණි.

**සමස්ථයක් වශයෙන් ගත් කළ අයදුම්කරුවන්ගේ මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 05

සේවකයන්ගේ පාරිතෝෂික ගෙවීම් ලැබීමට ඇති හිමිකම මත මෙම ප්‍රශ්නය පාදක විය. සමහර අයදුම්කරුවන් හොඳින් ලකුණු ලබාගෙන තිබුණි. සේවයෙන් අස්වන දිනට පාරිතෝෂික ගෙවීම් ලැබීමට හිමිකම් පෑම සඳහා සේවකයෙකු සපුරාලිය යුතු නිර්ණායකයන් දෙකක් සඳහන් කිරීමට අයදුම්කරුවන්ගේ බහුතරය අසමත් විය. මේ සඳහා නෛතික විධිවිධාන වලට යොමු නොවෙමින්, සාමාන්‍ය වූ සහ අදාල නොවන උත්තර ලියා තිබුණි.

පාරිතෝෂික ගෙවීම් ලැබීමට හිමිකම් ඇතැයි උපකල්පනය කරමින් **ඩිලාන්** නමැත්තාට ගෙවිය යුතු පාරිතෝෂිකය ගණනය කිරීම (b) කොටසින් අවශ්‍ය විය. පාරිතෝෂිකය ගණනය කිරීමට මාස භාගයක වැටුප උපයෝගී කරගන්නවා වෙනුවට, වැරදි අන්දමින් සමහර අය සම්පූර්ණ මාසයේ වැටුප පාදක කරගෙන ඇත. පාරිතෝෂික හිමිකම ගණනය කිරීමේදී සමහරුන් අංක ගණිතමය වැරදි සිදුකර තිබුණි.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නොවීය.**

## ප්‍රශ්න අංක 06

මූලික වෘත්තීය ආචාරධර්මයක් ලෙස "ස්වාධීනත්වය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය. සමහර අයදුම්කරුවන් මෙම විෂය මාතෘකාව ගැන දැනුවත් නැති බවද අදාල නොවූ හා වැරදි උත්තර සපයා තිබූ බවද නිරීක්ෂණය විය. බොහෝ අයදුම්කරුවන් ස්වාධීනත්වයට මුහුණත් දෙකක් ඇති බව නොසලකා හැර තිබුණි. එයින් එකක් මනසේ ස්වාධීනත්වය වන අතර අනෙක පෙනී සිටීම පිළිබඳ ස්වාධීනත්වයයි. සමහර අයදුම්කරුවන් එය වෘත්තීය ආචාරධර්මවල මූලික සිද්ධාන්තයක් වශයෙන් නොව පොදු කරුණක් වශයෙන් ගෙන අර්ථය පැහැදිලි කිරීමට තැත්කර ඇත.

**සමස්ථයක් වශයෙන් ගත් කළ ප්‍රශ්නය සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක නැත.**

## C කොටස

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයේ (a) කොටසින් රක්ෂණ නීතිය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර ඇත. රක්ෂණ නීතියේ අදාල සංකල්ප වලට සම්බන්ධකොට උත්තරය සාධාරණීය කිරීම සඳහා අදාල කරුණු නොදක්වා XYZ රක්ෂණ සමාගමෙන් රක්ෂණ ඔප්පුව යටතේ වන්දි ලබා ගැනීමට සපරමාදුට හිමිකම තිබේද, නැද්ද ගැන පමණක් සමහර අයදුම්කරුවන් සඳහන් කොට තිබූ අවස්ථා නිරීක්ෂණය විය. සමහර අයදුම්කරුවන් ඔවුන්ගේ උත්තරවල රක්ෂණයේ හානිපූරණය පිළිබඳ සංකල්පයට සම්බන්ධ නොකොට අදාල නැති රක්ෂණ සංකල්ප ගැන ලියා ඇත. උත්තර ලිවීමට පෙර ප්‍රශ්නය නියමාකාරයෙන් වටහා ගැනීමට අත්‍යවශ්‍ය වේ.

(b) කොටස තරමක් සරල ප්‍රශ්නයක් වූ අතර, චෙක්පතක ලක්ෂණ 4 ක් සඳහන් කිරීම අවශ්‍ය විය. බොහෝ අයදුම්කරුවන් හොඳින් උත්තර ලියා ඉහළ ලකුණු ලබා තිබුණි. "සඳහන් කරන්න" යන්න පමණක් අවශ්‍ය වුවද සමහර අයදුම්කරුවන් චෙක්පතක ලක්ෂණ සවිස්තරව දක්වා තිබුණි. ප්‍රශ්නයෙන් අපේක්ෂා කරන්නේ කුමක්දැයි උත්තර ලිවීමට පෙර අයදුම්කරුවන් අවබෝධ කරගත යුතුය.

**සමස්ථයක් වශයෙන් ගත්කළ උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායකය.**

## ප්‍රශ්න අංක **08**

කෝවලස්වාමි ව්‍යාපාරයක්, වගකීම් සීමාසහිත පෞද්ගලික සමාගමක් බවට පරිවර්තනය කිරීමට සපුරාලිය යුතු අවශ්‍යතාවයන් සඳහන් කිරීමට තිබූ මෙම ප්‍රශ්නයේ (a) කොටසටද, වගකීම් සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ 3 ක් පැහැදිලි කිරීමට (b) කොටසටද, අයදුම්කරුවන්ගෙන් බහුතරය සුදුසු ලෙස උත්තර ලියා තිබුණි. අයදුම්කරුවන් කිහිප දෙනෙකු පමණක් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේදී වැරදි සිදුකර ඇත.

(a) කොටසට අදාලව සංස්ථාගත කිරීමට අදාල ලියකියවිලි ඇතැම් අයදුම්කරුවන් නිශ්චිතව සඳහන් කර තිබුණේ නැත. (b) කොටසට අදාලව අතලොස්සක් පමණ අයදුම්කරුවන්, වගකීම් සීමාසහිත පෞද්ගලික සමාගමක් වෙනුවට වැරදි ලෙස සීමාසහිත පොදු සමාගමක ලක්ෂණ පැහැදිලි කර තිබුණි.

**සමස්ථයක් වශයෙන් මෙම ප්‍රශ්නයට උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක **09**

නියෝජ්‍යත්ව නීතිය පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කරන ලදී. බොහෝ අයදුම්කරුවන් (a) සහ (b) යන කොටස් දෙකටම හොඳින් ලකුණු ලබාගෙන ඇත. දී ඇති සිද්ධිදාමයේ හිටපු ප්‍රධානියා, හිටපු නියෝජිතයා විසින් එළඹුනු ගිවිසුම් සඳහා වගකීමට බැඳෙන්නේදැයි පැහැදිලි කිරීමට අවශ්‍ය විය. ඇතැම් අයදුම්කරුවන්, ප්‍රශ්නයේ දී තිබෙන සිද්ධි දාමයේ ප්‍රතිබන්ධනයෙන් (estoppel) ප්‍රධානියා සහ නියෝජිතයා අතර සම්බන්ධයක් ගොඩනැගී ඇති බව හඳුනාගැනීමට අපොහොසත් වී තිබේ. දී ඇති සිද්ධිදාමය මත නිවැරදි න්‍යායාත්මක පදනමක පිහිටා උත්තරය තර්කානුකූලව ඉදිරිපත් නොකර, හුදෙක් **කුමාර්ගෙන්** වන්දි ලබාගැනීමට සිල්වාට හිමිකම ඇත්දැයි යන වග පමණක් සඳහන් කළ අයදුම්කරුවන් අතලොස්සක් සිටි බවද නිරීක්ෂණය විය. (b) කොටස සඳහා නියෝජිතයෙකුගේ යුතුකම් 4 ක් සාර්ථක ලෙස අයදුම්කරුවන්ගෙන් බහුතරය සඳහන් කර තිබුණි.

**සමස්ථයක් වශයෙන් ගත්කල උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායක විය.**

# D කොටස

## ප්‍රශ්න අංක **10**

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත විය.

ප්‍රශ්නයෙහි (a) කොටස සඳහා ගිවිසුම් නීතිය යටතේ තැපැල් ගිවිසුම් මත පදනම්ව, දී ඇති සිද්ධි දාමයට යොමුවෙමින්, **B** නමැත්තාගේ නෛතික හිමිකම් විමසීමට ලක්කළ යුතුවේ. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට හොඳින් උත්තර ලියා තිබේ. එහෙත් ඇතැම් අයදුම්කරුවන් උත්තරය ලෙස, ප්‍රශ්නයේම දී තිබෙන කරුණු ගිවිසුම් නීතියට යොමුවීමක් නැතිව, ලියා තිබෙනු දක්නා ලදී. එම අයදුම්කරුවන් **B** නමැත්තාගේ නෛතික හිමිකම් ගැන අවසන් නිගමනයක් දක්වා නැත. ප්‍රතිග්‍රහණය කිරීමේ විධිය තැපැල් මගින් බවට පාර්ශවයන් සඳහන් කර ඇති හෙයින් එය අදාල කරගත යුතු වුවත් ඇතැම් අයදුම්කරුවන් තැපැල් නීතිය නොසලකා හැර තිබේ.

**සමස්ථයක් වශයෙන් ගත්කල මෙම කොටස සඳහා උත්තර ලිවීමේ කාර්යසාධනය සතුටුදායකය.**

(b) කොටසෙන් අවශ්‍යව ඇත්තේ සිද්ධිදාමයේ දී ඇති කරුණු මත පදනම්ව පරිගණක 100 හි පාඩුව **කමල්** විසින් දැරිය යුතුදැයි විමසා බැලීමයි. මෙය භාණ්ඩ විකිණීමේ ආඥා පනතට සම්බන්ධය. ප්‍රශ්නයේ දී ඇති සිද්ධිදාමයට සම්බන්ධව පවතින භාණ්ඩ, නිශ්චිත නොවූ භාණ්ඩ සහ නිශ්චිත භාණ්ඩවලට සම්බන්ධ නිවැරදි නෛතික කරුණු හඳුනා ගැනීමට අයදුම්කරුවන්ගෙන් බහුතරය අසමත් වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආධාරක කරුණු සහිතව අවසන් නිගමනයකට එළඹීමට ඔවුන්ට හැකි වී නැත. අයදුම්කරුවන්ගෙන් බහුතරය මෙම ප්‍රශ්නයට ඉතාමත් දුර්වල අන්දමින් උත්තර ලියා තිබේ. බොහෝවිට අයදුම්කරුවන් අදාල නොවන කරුණු මෙන්ම උත්තරය ලෙස ප්‍රශ්නයේ දී ඇති කරුණුම නැවත ලියා ඇත. සමහර අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයේ සිද්ධිය ගිවිසුම් නීතිය යටතේ ගොඩනැගුණු එකක් ලෙස පටලවාගෙන ඇත.

**සමස්ථයක් වශයෙන් බලනකල, අයදුම්කරුවන්ගෙන් බහුතරයක් අසාර්ථක උත්තර සපයා ඇත්තේ මෙම ප්‍රශ්නයේදී බව කිව හැකිය.**

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ කාර්යසාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානය යොමු කිරීම.

2. ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු පිළිතුරු සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

3. "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්නය තුළ භාවිත කර ඇති **<u>කළ යුතු ක්‍රියාව</u>** තුළින් බලාපොරොත්තු වන පිළිතුර ක්‍රියා නිර්වචනයට අනුකූල වන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

4. ස්ව-අධ්‍යයන පාඩම් මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා, ආදිය මැනැවින් පරිශීලනය කිරීම.

5. පිළිතුරු ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

6. අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

7. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

8. පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

9. ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සන්සන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

10. කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

11. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක / විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂා කර බැලීම.

12. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

**- * * * -**